www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ශ්‍රී ලංකා ආන්ඩුව යුද්ධයට සූදානම් වීමට නව ‘දේශප්‍රේමී පනතක්’ කෙටුම්පත් කරයි

## Sri Lankan government drafts new Patriotic Act in preparation for war

**නන්ද වික්‍රමසිංහ සහ කේ. රත්නායක විසිනි**

**2006 මැයි 25**

ශ්‍රී ලංකා ආන්ඩුව දෙමල ඊලම් විමුක්ති කොටින්ට (එල්ටීටීඊ) එරෙහිව නවීකරනය කරන ලද සිවිල් යුද්ධයක් දියත් කිරීමට සූදානම් වන බවට ඇති එක් පැහැදිලි ම දර්ශකයක් නම් අනිවාර්ය යුද සේවයට බඳවා ගැනීම, දැඩි මාධ්‍ය වාරනය සහ අන් ප්‍රජාතන්ත්‍ර විරෝධී විධානයන් පැනවීම සඳහා වන පලල් පරාසයක විහිදෙන නීති කෙටුම්පත් සකස් කිරීමට ඇති ඔවුන්ගේ සැලසුම ය.

වාර්ගික බියේ හා චින්තාපර බවේ වටපිටාවක් ගොඩ නැංවීමට මහින්ද රාජපක්ෂගේ හා ඔහුගේ ස්වෝත්තමවාදී සගයන්ගේ වැර වෑයම් තිබියදීත්, 1983 සිට 65,000 ඉක්මවූ ජීවිත බිලිගත් ගැටුමට කැපීපෙනෙන ආකාරයේ සහයෝගයක් නැත. නව නීති රීති කම්කරුවන්ට එරෙහිව එල්ල කර තිබේ; එමගින් තරුනයන්ට මිලිටරි භට පිරිසට එක්වීමට බල කරන අතර ඕනෑ ම මාධ්‍ය විවේචනයක් සහ ගැඹුරින්ම අප්‍රසාදයට ලක්ව තිබෙන යුද්ධයට ඇතිවන ඕනෑ ම විරුද්ධත්වයක් එමගින් මර්දනය කෙරේ.

නීති රීති පිලිබඳව සවිස්තර තවමත් නිකුත් කර නැතත් නව නීතිවල ස්වභාවය මාධ්‍යවලට කාන්දු වී තිබේ. සති දෙකක දී නීතිය පාර්ලිමේන්තුවේ සභාගත කරන බව ජනාධිපති ලේකම් ඩලස් අලහප්පෙරුම බ්‍රහස්පතින්දා ලෝසවෙඅඩවියට තිර කර පැවසී ය. මහජන ප්‍රතික්‍රියාව පිලිබඳව පවතින පැහැදිලි සංවේදීතාව සහ නීතියේ අන්තර්ගතය ගැන කල විමසීම්වලින් ඔහු මගහැරියේ ය.

මැයි 3 කලම්බු පේජ් වෙබ් අඩවියට අනුව බුෂ් පරිපාලනය විසින් 2001 සැප්තැම්බර් 11න් පසු පැනවූ පුලුල් ලෙස ප්‍රජාතන්ත්‍ර විරෝධී, නීති කරනය සිහි ගන්වමින් නව යෝජිත පනත හැඳින්වෙන්නේ දේශප්‍රේමී පනත යනුවෙනි. ශ්‍රී ලාංකික ජනාධිපති සමග සම්බන්ධ, නම් නොකරන ලද මූලාශ්‍ර මත පදනම්ව ලිපිය වාර්තා කරන්නේ, උතුරේ හා නැගෙනහිර යුද කලාපයන් තුලට යෙදවීම සඳහා නිත්‍ය හමුදා නිදහස් කර ගැනීමට, දකුනේ ආරක්ෂක කටයුතු වෙනුවෙන් 3000ක පමන සිවිල් බල ඇනියක් ගොඩ නගන බවයි.

කෙසේ වුවත් මෙම නීතිකරනයෙහි මීට වඩා දුර යන ඇඟවීම් පවතියි. නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුවේ ඉහල නිලධාරියෙකුගෙන් උපුටා දක්වමින් සතිපතා පලවන සිංහල පුවත්පතක් වන *රාවය* වාර්තා කලේ වයස 18-50 අතර පුද්ගලයින් මිලිටරි පුහුනුව ලබා ගැනීම මෙම නීතිය මගින් අනිවාර්ය කෙරෙන බවයි. එවන් පුහුනුවක අවශ්‍යතාව පිලිබඳව ලිපිය මගින් පැහැදිලි නොකෙරුන ද, එය පැහැදිලිව ම පූර්න බලහත්කාරයෙන් හමුදාවට බඳවා ගැනීම කෙරෙහි තබන ලද පියවරකි.

කලම්බු පේජ් වෙබ් අඩවියට අනුව අලුත් නීති අනිවාර්ය යුද සේවයට බඳවා ගැනීම සඳහා වන පවත්නා නීති ශක්තිමත් කරනු ඇත. 1985 උපයෝගිතා සහ අතිරේක බල ඇනි පනත යටතේ "ශ්‍රී ලංකාවේ අවුරුදු 18ට අඩු නොවූ ඕනෑ ම පුරවැසියකු... බඳවා ගැනීමට" සහ "ජාතික සේවා විධානය"ක් යටතේ ඔවුන්ට අතිරේක බල ඇනිවලට ඇතුලු කිරීමට බල ලත් අධිකාරිවරයෙකු පත් කිරීම සඳහා ජනාධිපතිට පුලුල් බලතල තිබේ.

සන්නද්ධ හමුදාවල සහ පොලීසියේ "බලය වැඩි වර්ධනය" සඳහා විවිධ අතිරේක බල ඇනිවල සේවය පිනිස බලෙන් බඳවා ගැනීම දැනටමත් අවශ්‍යව තිබෙනවා විය හැක. එවන් බල ඇනි "යුද සමයක දී ශ්‍රී ලංකාවේ ආරක්ෂාව සඳහා" හෝ "ඕනෑ ම කැරැල්ලක් හෝ නැගිටීමක් හෝ වෙනත් ඕනෑ ම සිවිල් කලබලකාරිත්වයක් වැලැක්වීමට සහ මර්දනය කිරීමට" උපයෝගි කර ගත හැකි ය. 1985 නීතිය පැනවූයේ උත්සන්න වන සිවිල් යුද්ධය සහ ජීවන තත්වයන්ට , රැකියාවලට සහ ප්‍රජාතන්ත්‍ර අයිතීන්ට වූ ආන්ඩුවේ ප්‍රහාරයන්ට නැග එමින් තිබූ විරුද්ධත්වය මධ්‍යයේ ය.

එහෙත් ජනාධිපති ජයවර්ධනට බලහත්කාරයෙන් යුද්ධයට බඳවා ගැනීම ක්‍රියාත්මක කල නොහැකි වූයේ එවන් පියවරක් ජනතා විරුද්ධත්වයක් අවුලුවා ලනු ඇතැයි යන භීතිය නිසා ය. ආන්ඩුව විසින් මේ දක්වා මිලිටරියට සහ අනෙකුත් අතිරේක හමුදාවලට භට පිරිස් ලබා ගැනීම පදනම් කරනු ලැබුවේ දුගී තරුනයන්ට ආර්ථික හේතු මත හමුදාවට බැඳීම හැර වෙනත් විකල්පයක් නොමැති වීම මත ය. අතිරේක පොලිස් බලකායක් ලෙස ග්‍රාමාරක්ෂක සේවය පිහිටවනු ලැබුවේ රැකියා විරහිතයින් "ස්වෙච්ඡාවෙන්" බඳවා ගැනීමෙනි. මිලිටරිය පරිපූරකයක් ලෙස පැරා මිලිටරි ඒකක පිහිටුවූයේ ද මේ අයුරිනි.

කෙසේ වෙතත් ශ්‍රී ලංකා මිලිටරිය 2002 එකඟතාවයට පෙරාතුව, මූලෝපායාත්මකව වැදගත් සිය එලිෆන්ට්පාස් කඳවුර අහිමිවීම ඇතුලු තීරනාත්මක පරාජයන් ගනනාවක්ම අත් වින්දේ ය. හමුදාවෙන් පලායාමේ රේට්ටුව වේගයෙන් ඉහල ගිය අතර හිස් තැන් පුරවා ගැනීමට සෑහෙන තරම් බඳවාගැනීම් කිරීමේ දී යුද හමුදාව දුෂ්කරතාවන්ට මුහුන දුන්නේ ය. සමස්තයක් ලෙස, දශක දෙකක යුද්ධය පුරාවට 50,000ක් තරම් වන පලා යාම්වලින් මිලිටරිය බැට කා ඇති බව තක්සේරු කැරේ.

1983 සිට සන්නද්ධ බලකායෙන් කලාපයේ විශාලතම ඒක පුද්ගල මිලිටරි මෙවලම බවට පත් වෙමින් ද්‍රවැන්තව පුලුල් විය. වර්තමානයේ යුද හමුදාවේ, නාවික හමුදාවේ සහ ගුවන් හමුදාවේ ඒකාබද්ධ ශක්තිය පුද්ගලයින් 157,000ක් තරම් වේ. එහෙත් නව යුද්ධයක් දියත් කිරීමට සූදානම් වන එක්සත් ජනතා නිදහස් සන්ධාන (එජනිස) ආන්ඩුව අනිවාර්යයෙන් සිදුවන ජීවිත හානි වෙනුවට අලුතින් බඳවාගැනීම ආර්ථික හේතු මත කෙරෙන බඳවා ගැනීමෙන් ඉටු කර ගත නොහැකි වනු ඇතැයි පැහැදිලිව ම කල්පනාකාරීව සිටී.

යුද්ධය යලි ඇතිවීම පිලිබඳව බිය හා විරුද්ධත්වය පුලුල්ව පැතිර තිබේ. මේ වසර මුලදී විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය විසින් කරන ලද ජන මත විචාරනයකට අනුව ජනගහනයේ අති විශාල බහුතරය - සිංහල සියයට 95, මුස්ලිම් සියයට 84.7 සහ දෙමල සියයට 90.6ක් - යුද්ධයට සාකච්ඡාමය අවසානයක් තිබිය යුතු යයි විශ්වාස කරති.

යුද හමුදාව සහ එල්ටීටීඊය අතර දැනටමත් විවෘත ගැටුම් මාලාවක් ඇති වී තිබෙන අතර මෑත ම සිද්ධිය වූයේ දෙපාර්ශ්වයෙන් ම 50ක් තරම මිය ගිය මැයි 11 වන දා ඇති වූ මුහුනට මුහුන ලා සිදු කෙරුනු දරුනු නාවික සටනය. ඒ හා සමග පලිගැනීම් හා එකට එක කිරීම් අවුලුවමින් මිලිටරිය සහ ඒ සමග පෙල ගැසුනු දෙමල පැරා මිලිටරි කන්ඩායම්, එල්ටීටීඊ සාමාජිකයන් සහ හිතවතුන් කුපිතකාරීව මරා දමන රහසිගත යුද්ධයක් පවතී. වසර ආරම්භයේ සිට බොහෝ සිවිල් ජනයා ද ඇතුලු සිය ගනනක් මරා දමා තිබේ.

ගැටුම උත්සන්න වෙද්දී යුද්ධයට පවතින විරුද්ධත්වය ද දැඩි වනු ඇත. ජනාධිපති රාජපක්ෂ සිය දේශප්‍රේමී පනත සූදානම් කරන්නේ තරුනයන් සන්නද්ධ හමුදාවලට බැඳ තැබීමට පමනක් නොව යුද්ධය පිලිබඳව වන ඕනෑ ම විවේචනයක් ද මර්දනය කර දැමීමට ය. නව නීතිය "ත්‍රස්තවාදී විමර්ෂනයට බාධා වන" ඕනෑ ම වාර්තාවක් වලක්වා ලීම ඇතුලු මාධ්‍ය වාරනය සඳහා වන ජනාධිපතිගේ හදිසි නීති බලතල තව දුරටත් ශක්තිමත් කරන බව පුවත්පත්වලට කාන්දු වූ විස්තරවලින් ඇඟවේ. එම නීතිය, යලිදු වතාවක් ත්‍රස්තවාදය සමග සටන් කිරීමේ නාමයෙන්, බැංකු හා මූල්‍ය ක්‍රියාකාරකම් මැඩීමේ ආන්ඩුවේ හැකියාව ද ශක්තිමත් කරනු ඇත.

සූදානම් වෙමින් පවතින්නේ කවර ආකාර දෙයක් ද යන්න රාජපක්ෂගේ සිංහල ස්වෝත්තමවාදී සගයන්ගේ - ජනතා විමුක්ති පෙරමුනේ (ජවිපෙ) හා ජාතික හෙල උරුමයේ (ජාහෙඋ) - ප්‍රකාශවලින් ඉතාමත් පැහැදිලිව පෙන්නුම් කෙරේ. දෙගොල්ලන් ම යුද්ධය වෙනුවෙන් උද්ඝෝෂනය කරති.

ජවිපෙ නායක විමල් වීරවංශ මාර්තු 7 වන දා පාර්ලිමේන්තුවට විශේෂ ප්‍රකාශයක් කරමින් මිලිටරියේ ක්‍රියාකාරකම් පිලිබඳ වාර්තා කිරීම ගැන මාධ්‍යයට පහර ගැසූ අතර තම පක්ෂය "මාධ්‍ය නිදහසට වඩා මව්බිමට ගරු කරන" බව ප්‍රකාශ කලේ ය. පක්ෂයේ පැරනි අධිරාජ්‍ය විරෝධයේ පූච්චානම් තිබිය දී ම වීරවංශ ශ්‍රී ලංකාවට සුදුසු මොඩලයක් ලෙස බුෂ් පරිපාලනයේ දේශප්‍රේමී පනතට හුරේ දැම්මේ ය. "එම රට පවා (ඇමරිකාව) සිය ජාතික අභිලාෂයන්ගේ පදනම මත අනෙක් සියලු ම දෙය පාලනය කිරීමට පියවර ගෙන තිබේ" යයි ඔහු දෙඩෙව්වේ ය.

මෙම මස අලුත් නීති පිලිබඳ පුවත්පත් වාර්තාවලින් අනතුරුව ජාහෙඋ ලේකම් ඕමල්පේ සෝභිත ආන්ඩුව මාධ්‍ය හා රාජ්‍ය නොවන සංවිධානවල විවේචන නොතකා හැර දේශප්‍රේමී පනත ක්‍රියාවට දැමිය යුතු යයි *ඉරිදා ලක්බිම* පුවත්පතට පැවසී ය. පුවත්පත් ඉලක්ක කර ගනිමින් ඔහු මෙසේ ප්‍රකාශ කලේ යඃ " මාධ්‍ය නිදහසට හා තොරතුරු දැන ගැනීමට (මහජනයාට) ඇති අයිතියට වඩා රටක ජාතික ආරක්ෂාව සහ ස්වයිරීත්වය රැක ගැනීම වැදගත් ය."

පසු ගිය වසරේ දී මිලිටරියේ ඉහල නිලධාරීහු සොල්දාදුවන්ගේ චිත්ත ධෛර්ය බිඳීම පිලිබඳව චිත්‍රපට අධ්‍යක්ෂකවරු හෙලා දකිමින් යුද විරෝධී චිත්‍රපටවලට එරෙහිව තමන්ගේ දේශපාලන උද්ඝෝෂනය දියත් කලෝය. "හමුදාවට පක්ෂපාත චිත්‍රපට" හදන ලෙසත් "යුද්ධය යලි ඇවිලුන හොත් ප්‍රතිඵලයන්ට" මුහුන දීමට සිදුවනු ඇති බවට තර්ජනාත්මකව අනතුරු අඟවමිනුත් රියර් අද්මිරල් සරත් වීරසේකර, හමුදා ප්‍රකාශක දයා රත්නායක සහ ජ්‍යෝෂ්ට ගුවන් හමුදා නිලධාරියෙක් අධ්‍යක්ෂවරු කීප දෙනෙකු මුන ගැසුනහ.

"ත්‍රස්තවාදයට" එරෙහිව නොව, යුද්ධයට පවතින ඕනෑ ම විරුද්ධත්වයකට සහ වඩා පොදුවේ ගත් කල කම්කරුවන්ට එරෙහිව එල්ල වන මෙම ප්‍රජාතන්ත්‍ර විරෝධී පියවරයන්ට කම්කරු පන්තිය විරුද්ධ විය යුතු ය. යුද්ධය සඳහා වන උද්ඝෝෂනය මත් රටේ ගැඹුරුවන සමාජ ආර්ථික අර්බුදය වලක්වා ලීමට ශ්‍රී ලංකාවේ පාලක ප්‍රභූවේ අසමත් බවේ නිශ්පාදනයකි. ජනතාවගෙන් බහුතරයකට යහපත් ජීවන කොන්දේසි සම්පාදනය කිරීමට අසමත් ව රාජපක්ෂ ආන්ඩුව ජවිපෙ සහ ජාහෙඋ සමග එක්ව වාර්ගික සහ ආගමික රේඛා ඔස්සේ කම්කරු පන්තිය බෙදා දැමීම පිනිස යලිත් වතාවක් වාර්ගික භීතිය හා වෛරය අවුලුවමින් සිටියි.

© www.wsws.org